# සිංහල සන්දේශ කවියා දුටු

## අපේ සමාජය.

සිංහල සාහිත්‍යයට සන්දේශ යනුවෙන් අංගයක් එකතු කිරීමේ අරමුණ ම දේශීය පරිසරය වර්ණනා කිරීමේ කැමැත්ත යයි සිතමි. අතීතයේ පැවති සම්ප්‍රදාය අනුව පද්‍යකරුවනට දේශීය පරිසරය ගැන කතා කරන්නට ලැබුණු අවස්ථා අඩු ය. ග්‍රන්ථ කරණය ආගම මුල් කරගත්තක් වූ බැවිනි. සමහර ගද්‍ය ග්‍රන්ථයක දේශීය තොරතුරු ඇතුළත් වුව ද සැලකිය යුතු තරමේ පරිසර වර්ණනාවකට එහි ඉඩක් නොවී ය. එහෙත් ගම්පොළ මයූර සන්දේශයෙන් ඇරඹෙන සන්දේශාවලිය මේ කාර්යය මැනවින් ඉටු කළේ ය. අපේ ගමේ වෙල් යාය, අපේ වතුපිටි, අපේ මුහුදු වෙරළ, අපේ පන්සල් හා ඒවායේ වැඩ සිටි යතිවරුන් ආදී බොහෝ දේ එතුළින් අපි දකිමු. ඉදිරිපත් කරන නිර්මාණාත්මක විලාසය නිසා අපි එයින් මහත් ආස්වාදයක් ද ලබමු. සාහිත්‍යයේ ප්‍රධාන අරමුණ විය යුත්තේ රස ජනනය කිරීම වන බැවින් සන්දේශ කරුගේ මේ උත්සාහය වෙසෙසින් අගය කළ යුතු ය.

**“පැසෙයි නිබඳ සුවඳැල් කෙත් වත් අවට**
**ඇසෙයි ළමා වසු පැටියන් හඬ දුරට”** - (හංස)

පැසුණු කෙත් යායත්, වසුපැටියන්ගේ හඬත් අපට සිහි ගන්වන්නේ කුමක් ද? අපේ ගමයි, ගමේ සිරියාවයි.

**“ඇසෙයි කියන රස ගි ලිය තුඩින් තුඩින්**
**දිසෙයි බසින ගව මී රළ කඩින් කඩින්**
**පැසෙයි රුවට කළ කෙත් වත් ගොඩින් මඩින්**
**තොසෙයි එගම දුට ඒ වැබඩින් වඩින්”** -(හංස)

අපේ ගමේ සිරිය, අපේ සම්පත සන්දේශකරුවා අපට සිහිපත් කර දෙයි. වසුපැටියන් සමඟ දුව පැන නටා සෙල්ලම් කළ, කුඹුරේ විවිධ අවස්ථාවන්හි ජන ගී ගයමින් වැඩ කළ ගෙවිලියන් දුටු, පීදෙන - පැසෙන ගොයමට ආදරේ කළ, ඒ ගොයම සමඟ කතා බස් කළ අපට කවියාගේ මෙම කියමන අප සිත් තුළ අතීත සුන්දර මතකයන් අලුත් කරයි.

කුඹුර සැම සන්දේශකරුවකුට ම පාහේ හොඳින් පෙනුණු දෙයකි. තිසරා පඟුරන් වෙල් එළියේ මුවන් ද දකී.(32) පරෙවියා දකින්නේ පඟුරන් වෙල් එළිය අවට වනයේ මල් තඹ වතුරට වැටෙන සැටිත් මඟුරන් ඒවා කා සැනසෙන සැටිත් ය.(110) සැලළිහිණියා අස්වන් ගුරුළුකෙතෙහි නන් අයුරින් සැරසුණු ගෙවිලියන් ක්‍රීඩා කරන සැටි (38) දකින අතර කෝකිලයා ද පඟුරන්

වෙල් එළියේ නෙත් සිත් වශී කරන කාන්තාවන් දකී.(49)

"ගිරවුන් තුඩින් මතු වන වෙහෙස සිතමිනේ
ඉසිමින් කඳුළු සිටි තැන සිට තැවෙන මෙනේ
පවනින් ලෙලෙන ඉස ඉස පිනි බිඳුන් ගෙනේ
පිඟුවන් කරල් තුඩු නැමී ඇල් කෙතුදු පෙනේ" (තිසර 118)

බිමට නැමුණු වී කරල්වල රැඳුණු පින්න බින්දු බින්දු බිමට වැටේ. එවිට වී කරල් අඬන්නා වැනි ය. ඇයි මේ අඬන්නේ? ඉදිරියේදී ගිරවුන් පැමිණ තමන් කඩාගෙන යන බැවිනි. ගිරවුන්ගෙන් වන පීඩාව සිහි වන විට බිම් බලාගෙන අඬනු විනා අසරණ වී කරල කුමක් කරන්න ද? ඇල් කෙතෙහි සිරියාවෙන් හා චමත්කාරයෙන් මෝහනය වුණු කවියා ගේ මේ කවි සංකල්පනයෙන් රසවත් වන රසිකයාට මේ කියමනත්, එයින් මැවෙන දර්ශනයත් කවදා අමතක වේ ද?

ගොවියාට ගවයා සම්පතකි. ඒ නිසා ඔහු ගවයන් ඇති කළේ රංචු වශයෙනි. වැලිවේරියේදී ගව මී රළන්ගේ නාදය හංසයාට ඇසෙන්නේ තූර්ය නාදයක් මෙනි.(151) මේ ගව රංචු පසුපස යමින් ඔවුන් මෙහෙයවමින් තණ කැවීම කළෝ ගොපලු දරුවෝ හෝ ගොපලු ලියෝ ය. මොවුනතුරින් සඳෙස් කවීන්ගේ ඇසට ලක්වුණේ ගොපලු ලියන් පමණකි. මේ ගොපලු ලියන්ගේ හැටි පරෙවියා දකින්නේ මෙසේ ය.

"කමින් තලා ගිලි හැලි පංගන් නැටිය
ලවන් පැහැය කළ විලසින් ගුරු මැටිය
වසන් මුගුරු නොපහල දනිනුඩ සිටිය
මෙවන් ගොපලු අඟනන් දකු පොතු පිටිය" (පරෙවි - 53)

මේ ගොපලු අඟනෝ බුලත්විට වෙනුවට තලා කොල, ගිනිමැල්ල පොතු හා පංගන් නැටි කා කට රතු කරගෙන සිටියෝ ය. වල් කැලෑ ඔස්සේ හරකුන් සමග යන්නට වන නිසා ඇඳි වත දණහිසෙන් උඩට කෙටි කර හැඳගත්තෝ ය. මේවා සැබෑ ගැමි ලියන්ගේ ලක්ෂණ යි. ගිරවා පොතුපිටියේදී (75) හා තිසරයා මොරටු එළියේදී (83) මෙම ගොපලු ලියන් දැක ඇත.

සිංහලයා කවදත් ගසට වැලට ඇලුම් කළේ ය. ගසින් වැලින් ඇති ප්‍රයෝජන දැන සිටියේ ය. මේ නිසා අපේ ගම් බිම් බොහෝ සෙයින් ගසින් වැලින් පිරී පැවතියේ ය. හංසයා එකට ඇමුණුවාක් මෙන් ඇති කෙත් වත් වතුපිටි පමුණුවේදී දකී.(123) කැළණි වෙහෙර වැඳ යන හංසයා කැලණි ගං දෙපස


උස්කෝලේ edulanka.lk

රැඳුණු වලාකුළු සේ වූ පොල්වතු දකී.(121)

"නිබඳ පැසී පල ලඹ දෙන මිහිරඹ ය
සුවඳ විහිද සිටි විලිකුන් කැන් රඹ ය"(හංස 158)

මේ කෑරගලදී හංසයා දුටු දර්ශනයකි. මෙහි දැක්වෙන අඹ ගස් හා රඹ කැන් අපේ පරිසරයේ අපට බෙහෙවින් සමීප දේ ය.

"බන් නේ මරා මිණි දුල පබලු මුතු පට
වැන්නේ ගමඹු ගෙලෙ පල මල් කුමුකුවට" - **(සැලළිහිණි 39)**

වෙළෙඳගොඩ නැමති ගම කාන්තාවකි. ඇගේ ගෙලෙහි මුතු මාලයක් බැඳ ඇත. එය නොයෙක් මරකත මාණික්‍ය හා පබළු වලින් අලංකාර වේ. මේ මාලය නම් කුමක් ද? ගමෙහි වැවී ඇති පුවක් වැටියයි. රස හැඟීමක් සිතට නංවන්නට කවියා යොදා ගත්තේ ද ගමෙහි වැවෙන පුවක් ගසයි. තිසරකරුවාට පොල් ගස සුදනෙකි. (64පද්‍යය) සුදනෝ තමන් වෙතට පැමිණෙන්නන් හොඳින් සතපති; වෙහෙස නිවති; කෑමෙන් බීමෙන් සංග්‍රහ කරති. එසේ ම ස්ථිර සාර ගති ඇත්තෝ ය. පොල් ගස ද එසේ ය. එය තමන් වෙත පැමිණියවුන්ට සෙවන දෙමින් වෙහෙස නිවයි; ගෙඩියේ පැනින් හා මදයෙන් ඔවුනට කෑම බීම සපයයි. එසේ ම එ ගස ස්ථිර සාර ගුණයෙන් ද යුතු ය. මෙසේ අපේ ගම්වල වැවුණු ගහ කොල ද සන්දේශ කවියෝ සිය නිමැවුම් සඳහා බෙහෙවින් යොදා ගත්හ.

ජනතා ආර්ථිකය ගැන කතා කරද්දී ගොවිතැන ගැන මෙන් ම වෙළඳාම ගැන ද සන්දේශකරුවෝ අපට තොරතුරු හෙළි කරති. සැලළිහිණියේ(39) මෙන් ම හංසයේ(72) ද දැක්වෙන වෙළෙඳගොඩ වෙළඳාම ගැන ප්‍රසිද්ධ ගමක් වන්නට ඇත. ගාල්ලේ උඩුතල නම් වෙළෙඳ වීථියක වෙළෙඳ ගැහැණුන්ගේ කෝලාහලය ගැන තිසරය(50) සඳහන් කරයි. ගිරාවෙහි කෝම් ගස් සෙවනේ නොවටිනා මිලට බඩු විකුණන වෙළන්දියන් ගැන (60) සඳහන් වේ. ගාල්ලේ සල්පිල්වල රන් මිණි මුතු වී යයි පරෙවියේ(84) දැක්වෙන සඳහන ද දෙවිනුවර නවරුවන් පිරුණු සල්පිල් වී යයි පරෙවියේ (158) දැක්වෙන සඳහන වෙළෙඳාමේ සරුසාර බව කියා පායි. වැලිගම්පටුනට යන පරෙවියාට ඉතා ධනවත් වෙළෙන්දන් (103) පෙන්වන සඳෙස්කරුවා ඔවුන්ගේ කපටිකම් ද (104) පරෙවියාට පහදා දෙයි. හංසයේ සඳහන් වන පරිදි ජයවර්ධන පුරයේ වීදි දෙපස සුවඳ විහිදන සල්පිල් වී ය.((23) ඒ කියන්නේ කාන්තාවන් සඳහා සුවඳ වර්ග බහුල වශයෙන් විකිණුණු බවයි.

සන්දේශ ලියැවෙන සමයේ අපේ රටේ කවුරුනුත් පාගේ ගමන් ගියේ පයිනි. පා ගමන බොහෝ වෙහෙසකර ය. මේ නිසා පයින්



edulanka.lk

යන්නන්ගේ විඩා නිවා ගැනීමට මග අසල පිහිටි මහ ගස් පිහිට විය. වැබඩ පසු කරන තිසරාට එසේ මිනිසුන් විඩා නිවා ගන්නට යොදා ගන්නා කොහොඹ ගසක් (106) හමු වෙයි. යටියන පැත්තට යන ගිරවා ද එවැනි කෝම් ගස් සෙවනක් (60) දකී. ඔහු එහි නො නැවතී යයි. ආසන්නයේ සිටින වෙළෙඳ ගැහැණුන් සුභාරම්මණයක් නොවුණු බැවිනි.

මෙසේ ගස් යට නවාතැන් ගන්නා මිනිසුන්ගේ ප්‍රයෝජනය තකා සමහර තැනක අම්බලම් ඉදි වී තිබුණි. එවැනි දර්ශනීය අම්බලමක් ගැන තිසරය සඳහන් කරයි. (33) ඒ කසරුප්පා අම්බලමයි. එගොඩ වීදිය පසුකරන හංසයා උදය දිවාකර මැතිඳුන් විසින් කරන ලද අම්බලමක් (67) දකී. පරෙවියාත්,(107) සැලළිහිණියාත්(33) යන දෙ දෙනා ම වල් අම්බලම දකිති. වැලිතොට ගමට යන ගිරවා අම්බලමක් ළඟ ගසෙක නවාතැන් ගනී.(110) අම්බලම ආසන්නයේ බොහෝ විට පොකුණක් ද විය. සැලළිහිණියේ කියන පරිදි වල් අම්බලම ළඟ පොකුණක් විය. කොල්ලම් ගසින් සෙවන වූ ඉවුරක් ඇති එහි කාන්තාවෝ සිසිලස වින්දෝ ය. යටියනට යන කෝකිලයා (117) මිනිසුන් පිහිනන තරමේ විශාල ගල් පොකුණක් දකී. මයූරයා (85) හා පරෙවියා (89) දකින මා නැවියා පොකුණේ ද ජලක්‍රීඩා කරන්නෝ වූහ.

පයින් ගමන් කරන්නන්ට ගං හෝ තරණයට ඒදඬු (පාලම්) තිබුණේ ය. පරෙවියාට අත්තිඩියේ(48) ඒදණ්ඩක් හමු වේ. තිසරාටපිරිමින්ගේ අත් අල්ලාගෙන බියෙන් මෙන් එගොඩ වන කාන්තාවන් උඟුරුවෙල ඒදණ්ඩ මත පෙනෙන්නේ ය.(107) තිසරයේ(36) පොල් අතු ඒය, පරෙවියේ(113) මාතොට පාලම, කෝකිලයේ(86) වැලිතොට ඒය, ආදිය එවැනි තවත් ඒවා ය. මේ වැලිතොට ඒය ගල් පාලමකි. එය තොටගමු විහාරයේ නායක හිමියන් විසින් මහජන යහපත තකා කරවන ලද්දකි. මහතොට (මාතොට) ගම පසුකරන පරෙවියා(113) හේ මැඳුරක් හෙවත් පාලම මත තනවන ලද අම්බලමක් දකී. දිවා කාලයේ ගමනෙහි යෙදී සවස එක තැනකට වන මිනිස්සු නිදිමත දැනෙන තුරු විවිධ දේ එකිනෙකා සමග කතා කරමින් කාලය මැරීම ස්වාභාවික සිද්ධියකි. වැලිතොට අම්බලමට රැස් වන මිනිසුන් එසේ කතා බස් කරන හැටි ගිරාසන්දේශ කරුවා (111 - 165)සවිස්තර ව දක්වයි.

“මත් වන අබිං කංසා කා රළු පරළු
අත්තන කුසුම් රත් මල් කනැ ලා ලකුළු
ගත් වන මුගුරු ළෙළවා ඇද ඇද රැවුළු
සිත්මෙන බමන බඹුරන් රඟ බල යහළු”- ( ගිරා 105))



ඉස්කෝලේ
edulanka.lk

මත් ද්‍රව්‍ය භාවිත කොට විකාර කරන්නෝ සමාජයෙහි කවදත් සිටිති. අබිං කංසා වැනි මත්ද්‍රව්‍ය භාවිත කොට අත්තන මල්, රත් මල් ආදිය පැළඳ රැවුළු අදිමින් පොලු අතට ගෙන මත් කම නිසා විකාර කරන ජන සමූහයක් ගැනයි ගිරා සන්දේශ කරු මේ කියන්නේ.

කිසියම් කාර්යයක් ආරම්භයේදී සුබාසුබ නිමිති ගැන සැලකීම එක් විශ්වාසයකි. සැලලිහිණියා ගමනට පිටත්වන්නේ හොඳ නැකතකිනි.(15) අස්විද නැකත උදා වී බ්‍රහස්පතී නැගෙනහිරින් මතු වන වේලාවට සඳ ද අහස මුදුනට පත් වූ කල ගමන පිටත් වන්නැයි දූතයාට සැලලිහිණිකරුවා කියයි. එසේ ම සුවඳ මුසු සුළඟත්, පිරුණු කළත්, මිහිරි අඹත්, පිපුණු සුදු මලුත්, ගැහැණුන්ගේ ප්‍රිය වචනයත්, රන් කෙණ්ඩිත්, සේසත් හා සලන සුදුචාමරත්, ශක්තිමත් ඇතුනුත් පෙරමඟ සුබ නිමිති යයි(16) සැලලිහිණිකරුවා කියයි. තිසරා දෙව්නුවරින් නිකුත් වන වේලාවට ඇසෙන දැනෙන ඇතුන්ගේ කුඤ්චනාද, අසුන්ගේ හේෂාරව, තරුණ කොමල ගැහැණුන්, සුවඳ මඳනල සුබ නිමිති සේ(23) දක්වා ඇත.

ආගම හා ආගමික ආයතන කවදත් මිනිසුන්ගේ සැලකිල්ලට පත්වූ ඒවා ය. ඒ නිසා සන්දේශ කරුවෝ ඒවා ගැන විශේෂයෙන් සඳහන් කරති. ඊශ්වර දෙවියන්, මහසෙන් දෙවියන්, කතරගම දෙවියන්, නාථ දෙවියන්, විභීෂණ දෙවියන් ආදී බොහෝ දෙවිවරුන් ගැන ද - බහිරව කෝවිල, මුන්නෙස්සරම, කාලිකෝවිල ආදී දේවාල රාශියක් ගැන ද සන්දේශවල සඳහන් වන්නේ එදා එවන් බොහෝ දේවාල රට පුරා පිහිටි හෙයිනි. මඟ යන දූතයාට එවන් දේවාල පෙනෙයි. එසේ ම දූතයා පනිවිඩය ගෙන ගොස් දෙවියන්ට සැළ කරයි. මෙයින් සාමාන්‍ය ජනතාව තුළ පමණක් නොව සන්දේශකරුවන් තුළ ද පැවති දේව භක්තිය මැනවින් පෙනේ.

ආගම ගැන කතා කිරීමේදී බෞද්ධ ආගමික මධ්‍යස්ථාන හෙවත් පන්සල් හා පිරිවෙන් ලංකාවේ ඉතා වැදගත් වෙයි. සන්දේශ කාරයෝ ද මේ ස්ථාන මහත් අභිරුචියෙන් වර්ණනා කළ සැටි පැහැදිලි ව පෙනේ. සන්දේශ කරුවන් කවුරුත් පාහේ බෞද්ධයන් වීම මීට හේතුවක් වන්නට ඇත. සැලලිහිණිකරුවා කැලණි විහාරයේ නැමදිය යුතු ස්ථාන දොලසක්(60 - 71) වෙන වෙන ම දක්වයි. එසේ ම ගමන ආරම්භ කරවන්නේ ද දළදා නැමදීමෙනි. කිත්සිරි මේ විහාරයේ දාගැබ, මහා බෝධිය හා බුදුපිළිමය ද නැමදිය යුතු ස්ථාන බව(42) පවසයි. කිත්සිරිමේ විහාරය මයූර(44) හා හංස(74) සන්දේශවල ද නැමදිය යුතු තැන් සේ දැක්වෙයි. තිසරයේ(58) හා කෝකිලයේ(79) ද ගිරාවේ


ඉස්කෝලේ edulanka.lk

(214,215,216) ද තොටගමු විහාරය වැදගත් පූජනීය තැනක් සේ දැක්වෙයි. කළුගං ඉවුරේ පිහිටි ගංගාතිලක විහාරය තිසර,(75,76) පරෙවි,(63) කොවුල්(97) අසුන්කරුවන්ගේ ගෞරවයට පාත්‍ර වූ තැනකි. තවත් දෙවිනුවර, දෙල්ගමුව, දැතිගම, දොරවක, පැපිළියාන ආදී බොහෝ විහාර සන්දේශ කරුවන්ගේ ගෞරවයට හා බහුමානයට පාත්‍ර වූ තැන් ය.

එදා පැවති අධ්‍යාපනය පන්සල් කේන්ද්‍ර කරගත් ඒවා වෙයි. ගිරා සන්දේශය (219 - 227) තොටගමු විජයබා පිරිවෙනත්, හංස සන්දේශය කෑරගල පත්මාවතී පිරිවෙනත්(172-181) විස්තර වශයෙන් ම සඳහන් කරයි. තොටගමු විජයබා පිරිවෙනේ ආගමික අධ්‍යාපනය මෙන් ම ලෞකික අධ්‍යාපනයත් ලබා දුන් ආයතනයකි. කෑරගල පත්මාවතී පිරිවෙන වැඩි වශයෙන් යොමු වුණේ ආගමික අධ්‍යාපනය දීමටයි. පන්සල් හා පිරිවෙන් ගැන කියන අතර ම සන්දේශ කරුවෝ විශේෂිත මහ තෙරවරුන් ගැන ද සඳහන් කරති. ගිරා සන්දේශයේ එන දහම් ඇදුරු මාහිමියෝ මුනි සසුන් නැමති නැවෙහි රන් කුඹ ගසක් මෙන් වෙති. සිවු පිරිසිදු සිල් ම බලය කරගත් මෙතුමෝ විනය නයත් දහම් නයත් ඉතා හොඳින් දැනගත් කෙනෙකි. දහම් නැමති විදුරවියෙන් ම පිළිමලුන් පැරදවූ කෙනෙක් වෙති. උන් වහන්සේ ඇසුරු කරන හිමිවරු ද සිල් සුවඳ විහිදුවන මෙත් කරුණා නිසා බබළන්නෝ වෙති. (56 පද්‍යය) එහි ම (69 පද්‍යය) දැක්වෙන පරිදි සුනේත්‍රාදේවී පිරිවෙන්හි නාහිමියෝ ද බුදුරදුන්ට ප්‍රතිපත්තියෙන් පූජා කරන, විනය පිළිබඳ හසල දැනුමක් ඇති, සිවු පිරිසිදු සිල්වලින් යුත්, දහම් දෙසුමෙහි පසිඳු හිමිනමකි. ගිරා සන්දේශ කරුවෝ විජයබා පිරිවෙන් හිමියන් ඉතා දීර්ඝ ලෙස ම වර්ණනා කරති. උන් වහන්සේගේ සිල්වත්කම පමණක් නොව විවිධ භාෂා ශාස්ත්‍රයන්හි උන් වහන්සේ තුළ ඇති උගත්කම හා හැකියා ද ඒ මගින් වර්ණනා කෙරෙයි. (233-247 පද්‍ය) හංස සන්දේශයේ ද මෙවැනි ම හිමි නමක් වර්ණනයට ලක් වෙති. ඒ කෑරගල පිරිවෙන් හිමි වනරතන මාහිමියෝ ය. උන් වහන්සේ නොයෙක් ශාස්ත්‍රයන්හි හසල දැනුමක් ඇති කෙනෙකු වුව ද බුදු දහම ම උසස් තැන ලා සලකන කෙනෙකි. (188-200 පද්‍ය) හංස සන්දේශයේ කැලණි වෙහෙර වැසි බුවනෙකබා හිමියෝ ද වැණුමට ලක්වෙති. කෝකිල සන්දේශයේ 82 හා 120 පද්‍යවලින් තෙවළා වදනිසුරු විජයබ තෙරිඳු ද, දහම්කිත් මාහිමි කෙනෙක් ද වර්ණනාවට ලක් වෙති.

"තුරු යටියෙන් හුණු පැටි ලෙහෙනුන් රැගෙන
සිතු අටියෙන් පිඹ ඇඟ පිරිමැද සෙමෙන


ඉස්කෝලේ edulanka.lk

මල ගෙටියෙන් පැන් පොවමින් අතිනතින
සිටි පැටියෙන් හෙරණුන්ගෙන් වෙයි සොබන"(ගිරා 208)

විහාර පරිසරය වර්ණනා කිරීමේදී යෙදූ මෙම පද්‍යයෙන් පැවසෙන අදහස එදා භික්ෂූන් වහන්සේ හා පන්සල් පරිසරය පිළිබඳ මනා වර්ණනයකි. ගසින් වැටුණු සතෙකුට ආදරය කිරීමට පොඩි හාමුදුරුවරුන්ගේ සිත නැමුණේ කෙසේ ද? විහාර පරිසරයෙන් ලත් ශික්ෂණය නිසා ය. ඒ ශික්ෂණය දුන්නෝ කවරහු ද වැඩිහිටි භික්ෂූන් වහන්සේ ය. බුදු දහමේ ඉගැන්වෙන කරුණා මෛත්‍රී ගුණාංග කුඩා කාලයේ සිට ම සිතට කා වැදී ඇති නම් ඒ හිමිවරුන් වැඩිහිටියන් වන විට කොතරම් ගුණයත් - සිල්වත් වන්නේ දැයි සිතාගත හැකි ය. ඒ පොඩි හිමිවරුනට ඒ ආදර්ශය දුන් වැඩිහිටි හිමිවරුන් කොතරම් ගුණවන්ත දැයි සිතාගත හැකි ය. මෙවැනි තවත් තැනක් හංස සන්දේශයේ හමුවේ.

**"කෙළනා බිඟු රැවින් බුදු මතුරු දපමින**
**සිටිනා තුරු වෙහෙර අතු අතිනි මල් ගෙන**
**යති නායක එහිමි බුදු බව ලබන දින**
**සිටිනා වැනිය පිට දෙන ලෙසට පතමින"**(හංස 167)

පන්සලේ අවට ඇති ගස්වල අතු අග මල් පිපී තිබීම හා එම ගස් නොසෙල්වී සිටීම කවියා කියන්නේ ඒ ගස් එක්තරා උසස් පැතුමක යෙදෙන බවයි. කුමක් ද, ඒ ? එම විහාරයේ නාහිමියන් බුදු වන දා තමන්ට පිට දී බුදු වේවා යන්න ය. මෙයින් කවියා කියන්නේ කුමක් ද? ඒ වෙහෙරෙහි නායක හිමියන් බෝසත් වරයෙකු වැනි ය යන්නයි. බෞද්ධ භික්ෂුවකට මීට වඩා ලැබිය හැකි ගෞරවය කුමක් ද? කවියා එම නාහිමියන් කෙරෙහි දැක්වූ බැතිබර බවත්, එදා වැඩ සිටි භික්ෂූන් වහන්සේලාගේ ගුණයත් මෙයින් පිළිබිඹු වන්නේ නොවේ ද?

ඉහත කී කරුණු අපට පැහැදිලි කරන්නේ අපේ පැරණි සන්දේශ කරුවන් දේශීය පරිසරය මෙන් ම දේශීය ජන සමාජය පිළිබඳ ව කොතරම් අවබෝධයකින් සිටියේ ද යන්නයි. ඔහු තමන් සැබවින් ම දුටු දේ කවියට නැගුවේ ය. ඒ නිසා අපේ පරිසරය සුන්දර ලෙස රස විඳීමට අපට හැකියාව ලැබුණි. සැබෑ කවියා තමන් ඉදිරියේ ඇති බාධක බිඳගෙන හෝ ඒවා නොසලකමින් හෝ සිය අරමුණ ඉටු කර ගනී. සන්දේශ කවීන්ගේ මේ ප්‍රයත්නයන්ගෙන් අප දකින්නේ ඒ උත්සාහයයි. සද්ධර්ම රත්නාවලී කාර ධර්මසේන හිමියෝ සම්ප්‍රදාය තුළ ම ඉඳ අවස්ථාව ලත් විගස දේශීයත්වය මතු කර ගනිති. ඒ නිසා එහි කතා පුවත් දේශීය නො වුව ද කතා පුවත් තුළින් දේශීය බව දැකීමට අපට පිළිවන් වෙයි. එහෙත් අපේ බොහෝ ගද්‍ය පද්‍ය

සාහිත්‍ය ග්‍රන්ථවල මෙය අපට දැකිය හැකි නො වෙයි. සමහර විට එය මාතෘකාවට අදාල නැතැයි කවියා සිතුවා වන්නට පිළිවන. නැතහොත් එය සම්ප්‍රදාය නොවේ යයි ඔහු සිතුවා වන්නට පිළිවන. කෙසේ වෙතත් සන්දේශකරු මෙය තමන්ගේ සම්ප්‍රදාය කර ගත්තේ ය.ඥ%

ආශ්‍රිත ග්‍රන්ථ:- අපේ පැරැණි අසුන් කවි - රෑ. තෙන්නකෝන්
සිංහලසන්දේශ සාහිත්‍යය - පුඤ්චිබණ්ඩාර සන්නස්ගල
සිංහල සාහිත්‍ය වංශය - පුඤ්චිබණ්ඩාර සන්නස්ගල
කෝට්ටේ යුගයේ සිංහල සාහිත්‍යය - කේ .ඩී. පී. වික්‍රමසිංහ
සිංහල ලේඛක පරපුර - කේ.ඩී. පී. වික්‍රමසිංහ
මයූර සන්දේශය - ආර්. පෙරේරා සංස්කරණය
තිසර සන්දේශය - බන්දුසේන ගුණසේකර සංස්කරණය
පරෙවි සඳෙස් පහදනය - අලවු ඉසි සැබිහෙළ
සැලළිහිණි සන්දේශය - සුචරිත ගම්ලත් ව්‍යාඛ්‍යාව
කෝකිල සන්දේශ වර්ණනා -
ඩබ්ලියු.ඇපේ. ගුණවර්ධන සංස්කරණය
හංස සන්දේශය - සී. ඊ. ගොඩකුඹුරේ සංස්කරණය


edulanka.lk